දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය

SUWASIRIPAYA

මගේඅංකය )
எனது இல )NA/06/T/14/2017
My No. )

ඔබේඅංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2018.12.03
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,ශ්‍රී ලංකා ජාතික රෝහල.
ශික්ෂණ රෝහල්/මහ රෝහල් /අධ්‍යක්ෂවරුන් හා
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් ,
ඇතුළු සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**මහරගම දන්තායතනය සඳහා හෙද/හෙදි නිලධාරී අභියාචනා කැඳවීම - 2017.**

හෙද/හෙදි නිලධාරීන්ට මහරගම දන්තායතනය සඳහා ස්ථාන මාරු ලබා දීමට අදාළව නිකුත් කරන ලද අංක 02-160/2017 හා 2017.08.21 දිනැති ස්ථාන මාරු චක්‍රලේඛය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද හෙද නිලධාරීන් අතරින් මාරු මණ්ඩලය හරහා ස්ථාන මාරු නිර්දේශ වී ඇති හෙද නිලධාරීන්ගේ හා නිර්දේශ වී නොමැති නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් නාම ලේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත.

03. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2017.06.30 දිනට එක් සේවා ස්ථානයක වසර හතරක (04)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ හා අපේක්ෂා රෝහල,අංගොඩ මූලික රෝහල,ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය හා වැලිසර ළය රෝහල යන සේවා ස්ථානවල 2017.06.30 දිනට වසර දෙක(02)ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ මුල් පත්වීම් දිනට ජ්‍යෙෂ්ඨතාවය සලකා ස්ථාන මාරු නිර්දේශ ලබාදෙන ලදී.

04. මෙම ස්ථාන මාරු ලේඛනයේ නිර්දේශය යටතේ **නිර්දේශ කරමු** ලෙස සඳහන් කර ඇත්තේ ස්ථාන මාරු ලබා දීමට ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශය ලැබී ඇති නිලධාරීන්ට වන අතර පුරප්පාඩු පවතින්නේ 02ක් වන බැවින් ඉතිරි නිලධාරීන්ට ස්ථාන මාරු අනුමත වී නොමැති බව කාරුණිකව දන්වමි.

05. මෙම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා හෝ නිවැරදි කිරීම් හෝ අභියාචනා හෝ පවතී නම්, එම විරෝධතා /නිවැරදි කිරීම් අභියාචනා 2018.12.17 දිනට පෙර ආයතන ප්‍රධානියා මඟින් විධිමත්ව අධ්‍යක්ෂ(පාලන)01,සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, කොළඹ 10. යන ලිපිනයට දනුම් දීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වන අතර අභියාචනා ඉදිරිපත් කළ යුතු අකෘතිය ඇමුණුම 01 මගින් දැක්වේ.

06. අදාළ අභියාචනා /විරෝධතා හා නිවැරදි කිරීම් සම්බන්ධව ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නිර්දේශයද සැළකිල්ලට ගෙන මහරගම දන්තායතනය සඳහා ස්ථාන මාරු නියෝග ඇතුළත් අවසන් ලේඛනය නිකුත් කරණු ලබන බව වැඩි දුරටත් දන්වමි.

07. එම ලේඛනය සෞඛ්‍ය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (www.health.gov.lk) පළ කරනු ලබන අතර, අභියාචනා/විරෝධතා හා නිවැරදි කිරීම් සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියකුට දැනුම් දෙනු නොලැබේ.

ඩොනල් මුරගේ
නියෝජ්‍ය අධ්‍ය... පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඩොනල්ඩ් මුරගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්( පාලන)02

අ/කළේ - වසන්තා පෙරේරා
ලේකම් ,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.